# මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන ගණයේ PL 1 කාණ්ඩයේ දෙපාර්තමේන්තුගත තනතුරු වන කම්කරු, දිස්පැන්සරි සහයක, මධ්‍යස්ථාන භාරකරු හා පශු උපස්ථායක තනතුරු සඳහා වන වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු පරිපාටිය

1. සම්බන්ධ වන ආයතන:-

1.1 දෙපාර්තමේන්තුව:- මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
යොමු අංකය:- සීපීසී/ඒපීඑච්/01/04 දිනය:- 2023-05-15

1.2 අමාත්‍යාංශය:- මධ්‍යම පළාත් කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන, මිරිදිය ධීවර, පරිසර කටයුතු, හින්දු සංස්කෘතික සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය
යොමු අංකය:- සීපීසී/එම්ඒ/1/7/1/4/7 දිනය:- 2023-06-05

1.3 මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය:-
යොමු අංකය:- සීපීසී/සීඑස්/01/04/15/05 දිනය:- 2023-07-06

1.4 මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:-
යොමු අංකය:-සීපීසී/පීඑස්සී/29/8/2 දිනය:-2023-08-08

1.5 මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය:-
යොමු අංකය:- දිනය:-

2. ක්‍රියාත්මක වන දිනය:- රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 වගන්තිය අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ දෙපාර්තමේන්තුගත තනතුරු වන කම්කරු, දිස්පැන්සරි සහයක, මධ්‍යස්ථාන භාරකරු හා පශු උපස්ථායක නිලධාරීන්ගේ වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු පරිපාටිය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද දින සිට ක්‍රියාත්මක වේ.

3. මෙම ස්ථාන මාරු පරිපාටිය මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරු වන කම්කරු, දිස්පැන්සරි සහයක, මධ්‍යස්ථාන භාරකරු හා පශු උපස්ථායක නිලධාරීන් වාර්ෂිකව පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල, පශු රෝහල් සහ මහනුවර, මාතලේ, නුවරඑළිය යන දිස්ත්‍රික්ක තුළ පිහිටි පශු වෛද්‍ය කාර්යාලවල අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ වන වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු පරිපාටිය වේ.

4. මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අදාළ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන ස්ථාන මාරු මණ්ඩලයක් විසින් වාර්ෂිකව අභ්‍යන්තර ස්ථාන මාරු ඉල්ලුම්පත් සහ අදාළ අනෙකුත් විස්තර සලකා බලා මාරු මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මත අදාළ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය අනුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ විසින් ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කරනු ලැබේ.

5. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවලින් පරිබාහිරව අනුමත කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව නොඉක්මවන පරිදි පහත දැක්වෙන හේතුමත ස්ථාන මාරුවීමක් කළයුතු යැයි පළාත් අධ්‍යක්ෂ විසින් අදහස් කරනු ලබන විට ඒ සඳහා ඔහුට/ඇයට බලය පැවරේ. එවැනි ස්ථාන මාරුවකින් අතෘප්තියට පත්වන නිලධාරීන්ට පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට හැකිය.

5.1 සේවා අවශ්‍යතාවය මත සිදු කරනු ලබන ස්ථාන මාරු කිරීම
5.2 අන්‍යෝන්‍ය ඉල්ලීම් මත කරනු ලබන ස්ථාන මාරු

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2023-08-21 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

5.3 විධිමත් ලෙස පත්කළ රජයේ වෛද්‍ය මණ්ඩලයක නිර්දේශ මත කරනු ලබන ස්ථාන මාරු

5.4 සේවා ස්ථානයේ වෙනසක් සිදු නොවන පරිදි සිදුකරනු ලබන අභ්‍යන්තර මාරු කිරීම්.

5.5 විනය නියෝගයක් මත හෝ විනයානුකූල ක්‍රියාමාර්ගයක අවශ්‍යතාවය මත හෝ කරනු ලබන ස්ථාන මාරු කිරීම්.

6. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම්

6.1 අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය ක්‍රියාත්මක කෙරේ.

6.2 මාරු මණ්ඩලය ස්ථාපනය කිරීම.
මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ දෙපාර්තමේන්තුගත තනතුරු වන කම්කරු, දිස්පැන්සරි සහයක, මධ්‍යස්ථාන භාරකරු හා පශු උපස්ථායක නිලධාරීන්ගේ ස්ථාන මාරු මණ්ඩලය වාර්ෂිකව ස්ථාපනය කෙරේ.

6.3 අදාළ සේවයේ තමන් කැමති (තනතුර අනුමත වී ඇති) වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරුවක් ලබාගැනීමට අයදුම් කළ යුතුය. එහිදී (8) වගන්තියේ කොන්දේසි කෙරෙහි අවධානය යොමු කර අදාළ අයදුම් කිරීම් කළ යුතුය.

6.4 එවැනි ඉල්ලුම්පත් දෙවැනි පරිශිෂ්ඨය පරිදි සකස් කර සිය ආයතන ප්‍රධානින් මඟින් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.

6.5 ස්ථාන මාරුවලදී සලකා බලනු ලබන පොදු කොන්දේසි පහත පරිදි වේ.

6.5.1 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම්වලදී සුදුසුකම් ලබන සේවා කාලය ගණනය කරනු ලබන්නේ පවත්නා වසරේ දෙසැම්බර් 31 දිනටය.

6.5.2 සේවා කාලය ගණනය කිරීමේදී අදාළ ආයතනයේ අඛණ්ඩව හෝ ඛණ්ඩව කළ සේවා කාලවල එකතුව මුළු සේවා කාලය ලෙස ගණන් ගනු ලැබේ.

6.5.3 යම් නිලධාරියෙකු ඉතා ප්‍රියමනාප, ප්‍රියමනාප සේවා ස්ථානයක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම්, ඔහුගේ/ඇයගේ මනාපය නොමැතිවද ප්‍රියමනාප නොවන/දුෂ්කර සේවා ස්ථානයක සේවා කාලය සම්පූර්ණ කල සේවකයින්ට ස්ථාන මාරුවීම් ලබාදීමට හැකිවන පරිදි ස්ථාන මාරුවක් ලැබීමට යටත්වනු ඇත.

6.5.4 නියමිත කාලය සම්පූර්ණ කර ඇති විට වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා අයදුම් කිරීම නිලධාරීන්ගේ වගකීම වන අතර එසේ නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇතත් අයදුම් නොකරන නිලධාරීන් ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට කැමති සේ සලකා ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි පුරප්පාඩු ඇතිවන ඕනෑම සේවා ස්ථානයකට ස්ථාන මාරු කරනු ලැබේ.

6.5.5 මාරුවීම් අපේක්ෂා නොකරන ඉතා ප්‍රිය මනාප හා ප්‍රිය මනාප සේවා ස්ථානයක වසර 03 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් තමා ස්ථාන මාරු අපේක්ෂා නොකරන්නේ වුවද ස්ථාන මාරු කළහොත් යාමට අපේක්ෂිත පශු වෛද්‍ය කොට්ඨාසය සඳහන් කර තෙවැනි පරිශිෂ්ඨය අනුව තොරතුරු තම ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් කැඳවන පළාත් අධ්‍යක්ෂ වෙත නියමිත දිනට පෙර අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතු වේ.

6.5.6 ඉහත 6.5.4 ඡේදයේ සඳහන් දෙවැනි පරිශිෂ්ඨය අනුව තොරතුරු ඉදිරිපත් කළ හා ඉදිරිපත් නොකළ වසර 05 කට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් පිළිබඳ තොරතුරු සිව්වන පරිශිෂ්ඨය අනුව නිවැරදිව සම්පූර්ණ කර පවත්වා ගැනීම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වගකීම වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2022 - 08 - 21 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

6.5.7 ස්ථාන මාරු ක්‍රියාත්මක වන දිනය ස්ථාන මාරු ක්‍රියාත්මක වන වසරේ ජනවාරි පළවන දින වේ.

6.5.8 අනුමත වැටුප් සහිත නිවාඩු ලබා සිටින නිලධාරීන් වැටුප් සහිත නිවාඩු කාලය අනුමත කරන අවස්ථාවල සේවය කළ ආයතනය, අදාළ සේවා ස්ථානය ලෙස සලකා සේවා කාලය ගණනය කරනු ලැබේ. අනුමත වැටුප් රහිත නිවාඩු ලබා ඇති කාල සීමාවක් ඇත්නම් එම කාලය නිවාඩු අනුමත කරන අවස්ථාවේ සේවය කළ සේවා ස්ථානයේ සේවා කාලයක් වශයෙන් ගණනය කරනු නොලැබේ. අනුයුක්තයකදී එම කාලය අනුයුක්ත කළ සේවා ස්ථානය පදනම් කරගෙන සේවා ස්ථාන වර්ගීකරණය සළකා බලා ලකුණු ගණනය කළ යුතුය.

6.5.9 සේවා ස්ථානයක පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය. දුෂ්කර සේවා ස්ථානයක නියමිත සේවා කාලය සම්පූර්ණ කර තිබුණද ස්ථානමාරු වීමක් ඉල්ලීමට අපේක්ෂා නොකරන්නේ නම් හා එම සේවා ස්ථානය සඳහා වෙනත් නිලධාරියෙකු අයදුම්කර නොමැති අවස්ථාවක දී අදාළ නිලධාරියා එම සේවා ස්ථානයේ තවදුරටත් සේවයේ යෙදවීම පිළිබඳ සලකා බැලිය හැක.

6.5.10 නිලධාරියාගේ ඉල්ලීම, දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය ආදී විශේෂ කරුණු නිසා මිස , නැත්නම් සාමාන්‍ය වශයෙන් වයස අවුරුදු 58 ඉක්මවූ නිලධාරීන් මාරු නොකළ යුතුය.

7. සේවා ස්ථාන වර්ගීකරණය

7.1 මධ්‍යම පළාතේ පශු වෛද්‍ය කොට්ඨාස සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කාර්යාලවල භූගෝලීය පිහිටීම හා ඒ මත නිර්මාණය වී ඇති පහසුකම් හා දුෂ්කරතා, මානව, භෞතික සම්පත් සහ නිලධාරීන්ගේ ඉල්ලුම් පදනම් කරගනිමින් වාර්ෂිකව සමාලෝචනය කිරීමට යටත්ව පහත සඳහන් පරිදි වර්ග කරනු ලැබේ. (පළමු පරිශිෂ්ඨය )

A වර්ගය - ඉතා ප්‍රිය මනාප

B වර්ගය - ප්‍රිය මනාප

C වර්ගය - ප්‍රිය මනාප නොවන

D වර්ගය - දුෂ්කර

7.2 ස්ථිර පදිංචිය අයත් වන්නේ මෙහි පළමුවන පරිශිෂ්ඨයෙහි සඳහන් ප්‍රිය මනාප නොවන/දුෂ්කර පශු වෛද්‍ය කොට්ඨාසයකම නම් එය ප්‍රිය මනාප නොවන/දුෂ්කර කොට්ඨාසයක් ලෙස නොසැලකේ.

8. ස්ථාන මාරුවක් ඉල්ලීමේදී සැලකිල්ලට ගනු ලබන කරුණු

8.1 ස්ථාන මාරුවක් ඉල්ලීමේදී සපුරාලිය යුතු අවම සේවා කාලය

8.1.1 දුෂ්කර සේවා ස්ථානයක (D) අවම වසර 02ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවක් අයදුම් කළ හැකි වේ.

8.1.2 ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක (C) අවම වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවක් අයදුම් කළ හැකි වේ.

8.1.3 ප්‍රියමනාප සේවා ස්ථානයක (B) අවම වසර 04ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවක් අයදුම් කළ හැකි වේ.

8.1.4 ඕනෑම සේවා ස්ථානයක වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු ස්ථාන මාරුවකට අනිවාර්යයෙන් යටත් විය යුතුය.

8.2 සියලුම නිලධාරීන් මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයක හා දුෂ්කර සේවා ස්ථානයක තම සේවා කාලය තුළ අවම වශයෙන් වසර 03 ක් වත් සේවය කර තිබිය යුතුය. එසේ නොවන නිලධාරියෙකු නම් ප්‍රිය මනාප නොවන හා දුෂ්කර සේවා ස්ථානයක සේවා කාලය සම්පූර්ණ කිරීමට යටත් වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2023 - 08 - 21 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

8.3 ස්ථාන මාරුවක් ලබා ගැනීම සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමය

8.3.1 සේවය කරන ලද පශු වෛද්‍ය කොට්ඨාසය අනුව නිලධාරියෙකුට ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය 60 කි.

8.3.2 ඉහත 7.1 වගන්තියේ දැක්වෙන සේවා වර්ගීකරණය අනුව ඒ ඒ සේවා ස්ථානවල සේවය කර ඇති කාලසීමාව සැළකිල්ලට ගෙන නිලධාරින්ට පහත දැක්වෙන පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

8.3.2.1 පශු වෛද්‍ය කොට්ඨාසය අනුව

| | | |
|---|---|---|
| A. ඉතා ප්‍රිය මනාප | - පූර්ණ වර්ෂයකට ලකුණු | 1 |
| B. ප්‍රිය මනාප | - -එම- | 2 |
| C. ප්‍රිය මනාප නොවන | - - එම - | 3 |
| D. දුෂ්කර | - - එම - | 4 |

(වසරකට අඩු එහෙත් මාස හයක් (6) ක් හෝ ඊට වැඩි කාලයක් යම් සේවා ස්ථානයක සේවය කර ඇත්නම් ඔහුට/ඇයට අදාළ සේවා ස්ථානය අයත් පශු වෛද්‍ය කොට්ඨාසයට හිමි ලකුණු ප්‍රමාණයෙන් 50%ක් හිමිවේ.)

8.3.3 නිලධාරියා සේවය කළ කාලය සලකා ඉහත පරිදි ලකුණු ලබාදිමට අමතරව ස්ථාන මාරු ලබාදිමේදි ස්ථාන මාරු මණ්ඩලය පහත සඳහන් කරුණුද ඇගයීමට ලක් කර ලකුණු ලබාදීමක් සිදුකෙරේ.

| | | |
|---|---|---|
| I. | ස්ථිර පදිංචිය | ලකුණු 10 |
| II. | කලත්‍රයාගේ රැකියා ස්ථානය/ස්වභාවය | ලකුණු 10 |
| III. | පාසල් යන දරුවන් සිටීම | ලකුණු 10 |
| IV. | මාරු මණ්ඩලයේ අභිමතය පරිදි සැලකිල්ලට ගත් විශේෂ කරුණු | ලකුණු 05 |
| V. | නිලධාරින්ගේ කාර්යසාධන ඉලක්ක සපුරා ගැනීම | ලකුණු 05 |
| | එකතුව = | ලකුණු 40 |

8.3.4. ඉහත සඳහන් කරුණු යටතේ ස්ථාන මාරු අයදුම් කරන සියලුම නිලධාරීන් දෙවෙනි පරිශිෂ්ඨයෙහි සඳහන් ආකෘති පත්‍රය පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් නියමිත දිනට පෙරාතුව ඉදිරිපත් කළ යුතුය.

9. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම.

9.1 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු මණ්ඩලය පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත වේ.

1) විෂය භාර අමාත්‍යාංශයේ නියෝජ්‍ය ප්‍රධානියෙක් හෝ සහකාර ප්‍රධානියෙකු
2) මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අදාල ආයතන කටයුතු භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකු
3) අදාළ සේවයට අයත් වෘත්තිය සමිතිය විසින් නම් කළ නියෝජිතයෙකු (අදාළ නියෝජිතයා ස්ථානමාරු ඉල්ලුම්පතක් ඉදිරිපත් කර නොමැති අයෙකු විය යුතුය)

9.2 ස්ථාන මාරු මණ්ඩලය වෙත ලැබී ඇති ඉල්ලුම්පත් හා අනෙකුත් විස්තර සැලකිල්ලට ගෙන සිය යෝජනා පළාත් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. පළාත් අධ්‍යක්ෂ විසින් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟතාවය මත වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කරනු ලැබේ.

...රු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 08 - 21 ....... දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

9.3 එම වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් වලින් අතෘප්තියට පත්වන නිලධාරීන් සිය අභියාචනා පස්වන පරිශිෂ්ඨයෙහි සඳහන් ආකෘතිය අනුව සකසා තම සේවා ප්‍රධානියා මඟින් පළාත්

අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එලෙස වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු නියෝගවලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබනුයේ දෙවැනි පරිශිෂ්ඨය හෝ තෙවැනි පරිශිෂ්ඨය හෝ මගින් ඉල්ලීම් ඉදිරිපත් කළ නිලධාරීන් හට පමණි.

9.4 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු අභියාචනා සමාලෝචන මණ්ඩලය සඳහා විෂය භාර අමාත්‍යාංශයේ හා පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත තිදෙනෙකුගෙන් යුත් කමිටුව අමාත්‍යාංශ ලේකම් විසින් පත්කරනු ඇත. ඉහත කී නිලධාරීන් අතුරින් ජ්‍යෙෂ්ඨතම නිලධාරියා කමිටු සභාපති වශයෙන් පත් කර ගත යුතුය. අභියාචනා සමාලෝචන මණ්ඩලයේ නිලධාරීන් ස්ථාන මාරු කමිටුව නියෝජනය නොවන නිලධාරීන් විය යුතුය.

9.5 සෑම වසරකම ඔක්තෝම්බර් 15 දිනට ප්‍රථම මෙම අභියාචනා මණ්ඩලය විසින් ඉදිරිපත්වී ඇති අභියාචනා සලකා බලා සිය නිර්දේශ අමාත්‍යාංශ ලේකම් වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. එම නිර්දේශ සඳහා පදනම් වූ හේතු ද එම වාර්තාවෙහි අඩංගු විය යුතුය.

9.6 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු මණ්ඩලය හා අභ්‍යන්තර ස්ථාන මාරු අභියාචනා මණ්ඩලයේ නිර්දේශ ද සලකා බලා වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග පළාත් අධ්‍යක්ෂවරයා විසින් නොවැම්බර් මස 01 දිනට පෙර නිකුත් කරනු ලැබේ.

9.7 ස්ථාන මාරු නියෝග ලබන සියලුම නිලධාරීන් ස්ථානමාරු කරනු ලබන දිනට එම නියෝග පරිදි නියමිත බලධාරීන් වෙත රාජකාරියට වාර්තා කළ යුතුය.

9.8 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු අභියාචනා මණ්ඩලය ලබා දෙන අවසන් තීරණයට එකඟ නොවන අවස්ථාවන් සම්බන්ධයෙන් තීරණ ගැනීමට විෂයභාර අමාත්‍යාංශ ලේකම්ට පූර්ණ හා අවසාන බලය පැවරේ.

10. ස්ථාන මාරුවීම් සඳහා කාල සටහන♦♦

| | | |
|---|---|---|
| i. | ස්ථාන මාරුවීම් ඉල්ලීම් භාරගන්නා අවසන් දිනය | - ජුලි 31 දිනට පෙර |
| ii. | ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම | - සැප්තැම්බර් 15 දිනටපෙර |
| iii. | අභියාචනා ඉදිරිපත් කළ යුතු අවසන් දිනය | - ඔක්තෝම්බර් 15 දිනට පෙර |
| iv. | අවසාන ස්ථාන මාරුවීම් නියෝග නිකුත් කිරීම | - නොවැම්බර් 01 දිනට පෙර |

♦♦ මෙම කාල පරාසයට අනුකූලව දින වකවානු වෙනස් කිරීමේ බලය අමාත්‍යාංශ ලේකම් සතුවේ.

11. පාලනය

මෙම වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු පරිපාටියෙහි විධිවිධාන සළසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂගේ නිර්දේශ මත ක්‍රියාත්මක කරනු ලැබේ.

12. මෙම පරිපාටියේ පිළිවෙලින් " ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ. " පළාත් අධ්‍යක්ෂ " යනුවෙන් මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2022 - 08 - 21 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

# සේවා ස්ථාන වර්ගීකරණය

| අනු අංකය | දිස්ත්‍රික්කය | කාර්යාලය හෝ පශු වෛද්‍ය කොට්ඨාශය | සේවා ස්ථාන වර්ගීකරණය |
|---|---|---|---|
| 01 | මහනුවර | පළාත් අධ්‍යක්ෂ කාර්යාලය | A |
| 02 | | නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය-මහනුවර | A |
| 03 | | පේරාදෙණිය පශු රෝහල | A |
| 04 | | ගලහ ප.වෛ.කා. | B |
| 05 | | තලාතුඔය ප.වෛ.කා. | A |
| 06 | | තෙල්දෙණිය ප.වෛ.කා. | B |
| 07 | | හසලක ප.වෛ.කා. | C |
| 08 | | පන්විල ප.වෛ.කා. | C |
| 09 | | ගම්පොල ප.වෛ.කා. | A |
| 10 | | උඩුනුවර ප.වෛ.කා. | A |
| 11 | | යටිනුවර ප.වෛ.කා. | A |
| 12 | | කුණ්ඩසාලේ ප.වෛ.කා. | A |
| 13 | | හාරිස්පත්තුව ප.වෛ.කා. | A |
| 14 | | අකුරණ ප.වෛ.කා. | B |
| 15 | | ගලගෙදර ප.වෛ.කා. | B |
| 16 | | වත්තේගම ප.වෛ.කා. | A |
| 17 | | දොළුව ප.වෛ.කා. | B |
| 18 | | පුස්සැල්ලාව ප.වෛ.කා. | B |
| 19 | | නාවලපිටිය ප.වෛ.කා. | B |
| 20 | | පූජාපිටිය ප.වෛ.කා. | B |
| 21 | | හතරලියද්ද ප.වෛ.කා. | B |
| 22 | | උඩදුම්බර ප.වෛ.කා. | C |
| 23 | | ගඟවට කෝරළේ ප.වෛ.කා. | B |
| 24 | | ගඟඉහළ කෝරළේ ප.වෛ.කා. | C |
| 25 | මාතලේ | නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය-මාතලේ | A |
| 26 | | මාතලේ ප.වෛ.කා | A |
| 27 | | විල්ගමුව ප.වෛ.කා. | D |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 08 - 21 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

| | | | |
|---|---|---|---|
| 28 | | රත්තොට ප.වෛ.කා. | B |
| 29 | | උකුවෙල ප.වෛ.කා. | B |
| 30 | | නාඋල ප.වෛ.කා. | A |
| 31 | | යටවත්ත ප.වෛ.කා | B |
| 32 | | දඹුල්ල ප.වෛ.කා. | A |
| 33 | | පල්ලේපොල ප.වෛ.කා. | B |
| 34 | | ගලේවෙල ප.වෛ.කා. | A |
| 35 | | ලග්ගල ප.වෛ.කා. | C |
| 36 | | අඹන්ගඟ කෝරළේ ප.වෛ.කා. | C |
| 37 | නුවරඑළිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය-නුවරඑළිය | B |
| 38 | | නුවරඑළිය ප.වෛ.කා. | B |
| 39 | | හැටන් ප.වෛ.කා. | B |
| 40 | | මස්කෙළිය ප.වෛ.කා. | C |
| 41 | | බගවන්තලාව ප.වෛ.කා. | C |
| 42 | | කොත්මලේ ප.වෛ.කා | C |
| 43 | | තලවකැලේ. ප.වෛ.කා. | B |
| 44 | | පූඩළුඔය ප.වෛ.කා. | B |
| 45 | | රිකිල්ලගස්කඩ ප.වෛ.කා. | B |
| 46 | | රාගල ප.වෛ.කා. | C |
| 47 | | ආගරපතන ප.වෛ.කා. | D |
| 48 | | ගිණිගත්හේන ප.වෛ.කා. | B |
| 49 | | පශු රෝහල- නුවරඑළිය | B |
| 50 | | තිස්පනේ ප.වෛ.කා. | D |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 09 - 21 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරු වන කම්කරු, දිස්පැන්සරි සහයක, මධ්‍යස්ථාන භාරකරු හා පශු උපස්ථායක තනතුරු සඳහා වන වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු අයදුම්පත්‍රය

1. දැනට සේවය කරන පශු වෛද්‍ය කොට්ඨාසය: ……………………………………………………..

1.1 එම පශු වෛද්‍ය කොට්ඨාසය අයත් දිස්ත්‍රික්කය: ……………………………………………..

1.2 වර්තමාන සේවා ස්ථානයේ ලිපිනය :- ………………………………………………………………

………………………………………………………………………………………………

1.3 දිස්ත්‍රික්කය: ……………………… 1.4 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: ……………………

2. නිලධාරියාගේ සම්පූර්ණ නම: ……………………………………………………………………

………………………………………………………………………………………………

2.1. ජාතික හැඳුනුම්පත් අංකය :- ……………………………………

3. ස්ථිර, පෞද්ගලික ලිපිනය: ……………………………………………………………………

………………………………………………………………………………………………

3.1 දිස්ත්‍රික්කය:……………………… 3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:……………………

3.3. දැනට පදිංචි ස්ථානයේ ලිපිනය:- ……………………………………………………………

………………………………………………………………………………………………

3.4. දුරකථන අංකය :- නිවස ………………………ජංගම……………………

4. උපන් දිනය :- ………………………

4.1 20…………… දිනට වයස :- අවු : ……… මාස :……… දින : ………

4.2 ස්ත්‍රී /පුරුෂ භාවය:-…………………

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 08 - 21 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

5. දැනට දරණ තනතුර:- ……………………………………………………………………

5.1 දැනට සිටින පන්තිය/ශ්‍රේණිය :- ……………………………………………

5.2 එම පන්තියට/ ශ්‍රේණියට පත්වූ දිනය:- ……………………………………………

5.3 මුල් පත්වීම් දිනය :- ……………………………………………………………

6. නිලධාරියා විවාහක/අවිවාහක ද යන බව :- ……………………………………………

6.1 කලත්‍රයාගේනම:- ……………………………………………………………………

6.1.1 කලත්‍රයාගේ සේවා ස්ථානය :- ……………………………………………………

6.1.1.1 දිස්ත්‍රික්කය:………………………6.1.1.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:……………

6.1.2 කලත්‍රයා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් සේවයේ ක්‍රියාන්විත සේවයේ නියුතුද? ……………

6.1.3 එසේනම් ඔහු/ඇය අයත්වන සේවාව හා තනතුර :- ……………………………………

6.2 දරුවන් ගණන, ඔවුන්ගේ නම් හා වයස්, පාසල් යන්නේ නම් ඔවුන්ගේ පාසල් :-

| දරුවන්ගේ නම | වයස | පාසල |
|---|---|---|
| | | |
| | | |
| | | |

7. සේවයට ඇතුලත් වූ දින සිට මේ දක්වා එක් එක් කාර්ය ස්ථානයක සේවය කර ඇති සේවා විස්තර:-

(මෙම ආකෘතියට සම්පූර්ණ කිරීමේදී කාර්ය ස්ථාන පිලිබඳ විස්තර ඉතා වැදගත් බැවින් මෙම ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් අනුරූප වෙනත් ඇමුණුමක් ඇතුලත් කරන්න.අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සැපයීම නොකළ යුතුය.)

| කාර්ය ස්ථානය | පශු වෛද්‍ය කොට්ඨාශය | දිස්ත්‍රික්කය | වර්ගීකරණය අනුව සේවා ස්ථානයේ වර්ගය (A,B,C,D) | කාල සීමාව | | මුළු සේවා කාලය | සේවය කරන ලද සේවා ස්ථානය අනුව තමන් විසින් අපේක්ෂා කරනු ලබන ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| | | | | සිට | දක්වා | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

8. කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීම පිලිබඳ විස්තර ( සනාථ කිරිම සඳහා ලිඛිත තොරතුරු සපයා තිබීම අත්‍යවශ්‍යයි.)

..........................................................................................................

..........................................................................................................

..........................................................................................

9. ස්ථාන මාරුව ඉල්ලා සිටින සේවා ස්ථාන (මනාපය අනුව අනුපිළිවෙළින් සේවා ස්ථාන නම් කරන්න)

i. ..........................................................................................

ii. ..........................................................................................

iii. ..........................................................................................

iv. ..........................................................................................

v. ..........................................................................................

10. ස්ථාන මාරු ඉල්ලීමට හේතු :-

i. ..........................................................................................

ii. ..........................................................................................

iii. ..........................................................................................

..........................................................................................

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 08 - 21 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

11. විශේෂයෙන් සඳහන් කිරීමට වෙනත් හේතු ඇත්නම් :-

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

12. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු පරිපාටිය අනුව තමාට හිමිවන්නේ යැයි අපේක්ෂා කරන ලකුණු ප්‍රමාණයන්

| අනු අංක | කාරණය | ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01 | සේවය කරන ලද සේවා ස්ථාන අනුව (6 ඡේදය යටතේ සඳහන් කර ඇති ලකුණුවල මුළු එකතුව සටහන් කරන්න) | |
| 02 | ස්ථිර පදිංචිය | |
| 03 | කලත්‍රයාගේ රැකියා ස්ථානය/අභාවය | |
| 04 | පාසල් යන දරුවන් සිටීම | |
| 05 | කාර්ය සාධනය (ලිඛිත තහවුරු කිරීම් සහිත) | |

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බව මම ප්‍රකාශ කරමි. මා විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා හට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බව මම දනිමි.

දිනය:- ..................................

...................................................

( නිලධාරියාගේ අත්සන)

---

## II කොටස

දැනට අනුයුක්තව සේවය කරන සේවා ප්‍රධානියාගේ නිර්දේශය/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි. සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව නිලධාරියා මුදා හැරිය හැකිය.

දිනය ...............

....................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 08 - 21 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

III කොටස

<u>දුෂ්කර සේවා ස්ථානයක තවදුරටත් සේවය කිරීමට එකඟතාවය</u>

දුෂ්කර සේවා ස්ථානයක වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති වුවත් තවදුරටත් එම සේවා ස්ථානයේ සේවය කිරීමට එකග බව ප්‍රකාශ කරමි.

දිනය:- ……………………………..                    ……………………………………………

( නිලධාරියාගේ අත්සන)

---

## IV කොටස

<u>ස්ථාන මාරු මණ්ඩලයේ යෝජනා</u>

…………………………………………………………………………………………………………

…………………………………………………………………………………………………………

…………………………………………………………………………………………………………

…………………………………………………………………………………………………………

සාමාජිකයින්

| නම | තනතුර | අත්සන | දිනය |
|---|---|---|---|
| 01 ………………………………… | ……………………… | ……………… | ………… |
| 02 ………………………………… | ……………………… | ……………… | ………… |
| 03 ………………………………… | ……………………… | ……………… | ………… |
| 04 ………………………………… | ……………………… | ……………… | ………… |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 08 - 21 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරු වන කම්කරු, දිස්පැන්සරි සහයක, මධ්‍යස්ථාන භාරකරු හා පශු උපස්ථායක තනතුරු සඳහා වන වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු අයදුම් නොකරන නිලධාරීන් විසින් සම්පූර්ණ කළ යුතු අයදුම්පත්‍රය**

1. දැනට සේවය කරන පශු වෛද්‍ය කොට්ඨාශය :- ....................................................

 1.1 එම පශු වෛද්‍ය කොට්ඨාශය අයත් දිස්ත්‍රික්කය :- ........................................

 1.2 වර්තමාන සේවා ස්ථානයේ ලිපිනය :-

 1.3 දිස්ත්‍රික්කය:................................ 1.4 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය:.........................................

2. නිලධාරියාගේ සම්පූර්ණ නම :-....................................................................

 ..............................................................................................

 2.1.ජාතික හැඳුනුම්පත් අංකය ......................................................

3. ස්ථිර, පෞද්ගලික ලිපිනය :- ....................................................................

 ..............................................................................................

 3.1 දිස්ත්‍රික්කය:................................ 3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය:...............................

 3.3. දැනට පදිංචි ස්ථානයේ ලිපිනය :- .............................................................

 ..............................................................................................

 3.4. දුරකථන අංකය :-නිවස.........................................ජංගම ..........................

4. උපන් දිනය :-...............................

 4.1 20.......... දිනට වයස :- අවු : .......... මාස :.......... දින : ...........

 4.2 ස්ත්‍රී/පුරුෂ භාවය :- ....................................

5. දැනට දරණ තනතුර:- ................................................................

 5.1 දැනට සිටින පන්තිය/ශ්‍රේණිය :- ................................................

 5.2 එම පන්තියට/ ශ්‍රේණියට පත්වූ දිනය:- ............................................

 5.3. මුල් පත්වීම් දිනය :- ...........................................................

6. නිලධාරියා විවාහක/අවිවාහක ද යන බව :- ................................................

 6.1 කලත්‍රයාගේ නම :-.................................................................

 6.1.1 කලත්‍රයාගේ සේවා ස්ථානය :- ..............................................

 6.1.1.1 දිස්ත්‍රික්කය:..............................6.1.1.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:........................

 6.1.2 කලත්‍රයා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් සේවයේ ක්‍රියාන්විත සේවයේ නියුතුද? ......................

 6.1.3 එසේනම් ඔහු/ඇය අයත්වන සේවාව හා තනතුර :- ......................................

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023-08-21 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

6.2 දරුවන් ගණන, ඔවුන්ගේ නම් හා වයස්, පාසල් යන්නේ නම් ඔවුන්ගේ පාසල් :-

| දරුවන්ගේ නම | වයස | පාසල |
|---|---|---|
| | | |
| | | |
| | | |

7. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා අයැදුම්කර නොමැති බැවින් ස්ථාන මාරුවක් ලබා දුනහොත් සේවය කිරීමට කැමති පශු වෛද්‍ය කොට්ඨාශ 03 ක් ( කැමැත්ත අනුපිළිවෙලින් )

7.1 ……………………………………………………………………………………………

7.2 ……………………………………………………………………………………………

7.3……………………………………………………………………………………………

8. විශේෂයෙන් සඳහන් කිරීමට හේතු ඇත්නම් :-

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

………………………………………………………………………………………

දිනය :- ……………………………………

……………………………………

නිලධාරියාගේ අත්සන

---

## II කොටස

දැනට අනුයුක්තව සේවය කරන සේවා ප්‍රධානියාගේ නිර්දේශය/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි. සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව නිලධාරියා මුදා හැරිය හැකිය.

දිනය ……………

……………………………

ආයතන ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023-08-21 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

## III කොටස

<u>දුෂ්කර සේවා ස්ථානයක තවදුරටත් සේවය කිරීමට එකඟතාවය</u>

දුෂ්කර සේවා ස්ථානයක වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති වුවත් තවදුරටත් එම සේවා ස්ථානයේ සේවය කිරීමට එකඟ බව ප්‍රකාශ කරමි.

දිනය:- ……………………………..                ……………………………………………

( නිලධාරියාගේ අත්සන)

---

## IV කොටස

<u>ස්ථාන මාරු මණ්ඩලයේ යෝජනා</u>

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

සාමාජිකයින්

| නම | තනතුර | අත්සන | දිනය |
|---|---|---|---|
| 01 ……………………………………… | ……………………… | ……………… | …………. |
| 02 ……………………………………… | ……………………… | ……………… | …………. |
| 03 ……………………………………… | ……………………… | ……………… | …………. |
| 04 ……………………………………… | ……………………… | ……………… | …………. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 08 - 21 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

- ❖ එක් පශු වෛද්‍ය කොට්ඨාසයක අවුරුදු 5 කට වැඩි කාලයක් සේවය කර ඇති මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කම්කරු, දිස්පැන්සරි සහයක, මධ්‍යස්ථාන භාරකරු හා පශු උපස්ථායක සියලුම නිලධාරීන්ගේ විස්තර මෙහි අනිවාර්යයෙන් ඇතුළත් විය යුතු බව සලකන්න.
- ❖ එකම සේවා ස්ථානයක වැඩිම සේවා කාලයක් සහිත නිලධාරීන්ගේ නම් මුලින්ම සඳහන් කළ යුතු බව සලකන්න. (සේවා කාලය ගණනය කළ යුත්තේ පවත්නා වසරේ දෙසැම්බර් 31 දිනටය.)

| නිලධාරියාගේ නම (මයා/මිය/මෙනවිය) යන්න සඳහන් කරන්න. | ජාතික හැඳුනුම් පත් අංකය | තනතුර හා ශ්‍රේණිය | උපන් දිනය හා ......... ......... ......... දිනට වයස | වර්තමාන සේවා ස්ථානය හා එහි සේවා කාලය දෙසැම්බර් 31 දිනට | වර්තමාන සේවා ස්ථානයේ වසර 05ට වඩා සේවය කර ඇත්නම් ඊට හේතු | විවාහක/ අවිවාහක බව | කලත්‍රයාගේ සේවා ස්ථානය | දරුවන් සංඛ්‍යාව හා පාසැල් යන දරුවන් ගණන | ස්ථිර පදිංචිය අනුව අයත් පශු වෛද්‍ය කොට්ඨාසය හා පදිංචි ලිපිනය | මුල් පත්වීමේ දින සිට සේවය කළ ස්ථාන හා සේවය කළ කාල සීමාව | වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා අයැදුම් කර තිබේද? අයැදුම්කර නොමැති වුවත් ස්ථාන මාරුවක් ලැබුණහොත් සේවය කිරීමට කැමති ආයතන 03 ක් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

සකස් කළේ : අත්සන -

නම -

දිනය -

පරීක්ෂා කළේ : අත්සන -

නම -

දිනය -

නිවැරදි බවට නිර්දේශය-

පළාත් අධ්‍යක්ෂ,

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023 - 05 - 31 ..... දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

<u>දෙපාර්තමේන්තුගත තනතුරු වන කම්කරු, දිස්පැන්සරි සහයක, මධ්‍යස්ථාන භාරකරු හා පශු උපස්ථායක තනතුරු සඳහා වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම් සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනය</u>

1. නිලධාරියා පිළිබඳ විස්තර

   1.1. සම්පූර්ණ නම :- ……………………………………………………………………..
   1.2. අයත් සේවය :- ……………………………………………………………………...
   1.3. තනතුර :- …………………පන්තිය / ශ්‍රේණිය ……………………
   1.4. සේවා ස්ථානය:- ……………………………………………………………………….
   1.5. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය :-……………………………………………

2. අභියාචනයට පදනම්ව ඇති තීරණය/ නියෝගය පිළිබඳ විස්තර

   2.1. තීරණය/නියෝගය කුමක්ද? යන වග සැකෙවින්

   ……………………………………………………………………………………………
   ……………………………………………………………………………………………
   ……………………………………………………………………………………………
   ……………………………………………………………

   2.2. තීරණය/ නියෝගය නිලධාරියාට ලැබුණු දිනය :- ……………………………………..
   2.3. තීරණය/ නියෝගය දැක්වෙන ලිපිවල සහතික කළ පිටපත් පහතින් දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.

   ඇමුණුම 1 ……………………………………………………………………

   ඇමුණුම 2 ……………………………………………………………………

   2.4. අදාළ වෙනත් කරුණු :-……………………………………………………………

   ……………………………………………………………………………………

3. තීරණයට/නියෝගයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු

   3.1. ……………………………………………………………………………………
   3.2. ……………………………………………………………………………………
   3.3. ……………………………………………………………………………………
   3.4. ……………………………………………………………………………………
   3.5. මෙම හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධක වල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.

   ඇමුණුම 1 ……………………………………………………………………

   ඇමුණුම 2 ……………………………………………………………………

   ඇමුණුම 3 ……………………………………………………………………

4. ඉල්ලා සිටිනු ලබන සහන:-

   ……………………………………………………………………………………………
   ……………………………………………………………………………………………
   ……………………………………………………………………………………………
   ……………………………………………………………………………

දිනය:- ………………………..

අත්සන :- ……………………………….
නම :- ……………………………….

තනතුර :- ……………………………….

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023-08-21 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- නිර්දේශ කරමු

1. පී.ජී.අමරකෝන් මහතා (සභාපති) ........................................
2. ඩබ්ලිව්.එම්.එස්.ඩී.වීරකෝන් මහතා (සාමාජික) ........................................
3. ඒ.එම්.වයිස් මහතා (සාමාජික) ........................................
4. ඒ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා (සාමාජික) ........................................
5. එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා (සාමාජික) ........................................
6. ජේ.ඩී.කේ.වික්‍රමරත්න මහතා (සාමාජික) ........................................
7. පී.ටී.ජී. ගුණතිලක මහතා (සාමාජික) ........................................

දිනය : 2023.08.08

ආණ්ඩුකාර ලේකම්,

2023.08.08 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 2023/1340 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද "මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන ගණයේ PL I කාණ්ඩයේ දෙපාර්තමේන්තු ගත තනතුරු වන (කම්කරු, දිස්පැන්සරි සහයක, මධ්‍යස්ථාන භාරකරු හා පශු උපස්ථායක) තනතුරු සඳහා වන වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු පරිපාටිය" ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය : 2023/08/08

........................................
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

නිල මුද්‍රාව.

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය :- අනුමත කරමි. / නොකරමි.

2023-08-21

නීතිඥ ලලිත් යූ ගමගේ
ආණ්ඩුකාර
මධ්‍යම පළාත